## හානිය

කිටයින් විසින් කරල් වලට හානි කර බීජ කා දැමීම සිදු කරයි.

## පාලනය

නොවලියුරෝන්, තයෝඩිකාබ් හා එතොෆෙන්ප්‍රොක්ස් වැනි කෘමිනාශක භාවිතය.

## කුඩිත්තා *(Rhopalosiphum maidis)*

- කොළ පැහැති කුඩා කෘමියෙකි.
- පත්‍ර වලින් යුෂ උරා බීම නිසා පත්‍ර කහ පැහැ වේ
- ශාක වල වර්ධනය බාල වේ
- පුමංගි මල් වලට හානි කිරීම නිසා පරාග විසිරීමට බාධා ඇතිවේ



## පාලනය

ඉමිඩක්ලොප්‍රිඩ් 20 එස්.එල් 400 මි.ලි/හෙක්

ෆිප්රොනිල් 5 එස්.සී 500 මි.ලි/හෙක්

## බඩඉරිඟු ගුල්ලා *(Sitophilus zeamais)*

- සුහුඹුලා මි.මී 3-4 ක් පමණ දිගැතිය. දුඹුරු පැහැතිය
- සුදු පැහැති බිත්තර බීජය ඇතුලත තැන්පත් කරයි



## හානිය

- බීජ වල අක්‍රමවත් සිදුරු සාදයි

වැඩි විස්තර සඳහා
අධ්‍යක්ෂ
ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
මහඉලුප්පල්ලම

දුරකථන:- 025-2249177, 025-2249132

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by: AGRICULTURE PRESS, Gannoruwa.

අපි වවමු - රට නඟමු

දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007-2010



# රළු ධාන්‍ය භෝග වගාවේ පළිබෝධ

## (බඩඉරිඟු, කුරක්කන්, සෝගම්)



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

## පුරුක් පණුවා (*Chilo partellus*)

- භෝගය සිටුවා සති 3-4 සිට කරල් මෝරන අවධිය තෙක් මෙම හානිය ඇති විය හැකිය
- සුහුඹුලා පිදුරු පැහැති මි.මී. 15 ක් පමණ විශාල සලබයෙකි
- කීටයින් ලා කහ පැහැති වන අතර පෘෂ්ඨියව කළු තිත් සහිතය. වැඩුනු කීටයින් මි.මී 20-25 ක් පමණ දිගය
- පිලා අවධිය කඳ තුල ගතකරයි

**සුහුඹුලා**



**කීටයා**



## හානිය

- පුරුක් පනු කීටයා විසින් බඩඉරිඟු පැලයේ මුල් හැරුණු විට අනෙකුත් සියළුම කොටස් වලට හානි සිදුකරයි
- ළපටි කීටයින් හානි කිරීම නිසා පත්‍රවල කුඩා සිදුරු දක්නට ලැබේ
- වැඩුණු කීටයින් විසින් පැලවල වර්ධක ස්ථානයට හානි කරයි. එවිට ගොබය මැරී ගොස් "මල හදවත"නම් තත්වය ඇති වේ
- හානියට පාත්‍ර වූ පැලවල වර්ධනය අඩු වේ. පහසුවෙන් ඇද වැටීමට පාත්‍ර වේ
- කරල් වලට හානි කිරීම නිසා බීජ විනාශ වේ





## පාලනය

මහ කන්නයේ වර්ෂාවත් සමඟ බෝගය යෙන්ත්‍රයේ සිටුවීම

### රසායනික පාලනය

- ඩයසිනෝන් 5% කැට (10-15 කි.ග්‍රෑ./හෙක්) එක් වරක් ගොබය තුලට යෙදීම
- නොවලියුරෝන්, තයෝඩිකාබ්, එතොෆෙන්ප්‍රොක්ස් වැනි කෘමිනාශක දින 25-35 හා දින 45-55 කින් වගාවට දෙවරක් ඉසීම

## කරල් විදින දළඹුවා (*Helicoverpa armigera*)

- සුහුඹුල් සතා දුඹුරු පැහැති සලබයෙකි.
- වැඩුනු කීටයින් මි.මී. 40-50 ක් පමණ දිගැති වන අතර විවිධ වර්ණ ගනී
- පිලා අවධිය පසෙහි ගත කරයි

**සුහුඹුලා**



**කීටයා**

